---

**ඇල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 10 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 16 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඇල්ල ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 උනට රු.934,587 ක් වූ හිඟ ජල ගාස්තු රු.170,172 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා දෙසැම්බර් 31 දිනට ණයගැතියෝ රු.764,415 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් වටිනාකම රු.113,400 ක් වූ වතුර ටැංකි 2 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතු පොලී වියදම රු.708,197 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌනතාවය රු.1,416,394 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) රු.3,153,056 ක් වූ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.5,494,895 ක් ලෙස රු.2,341,839 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,460,775 ක් වූ සමුච්චිත අරමුදල හා සංචිත ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.11,190,136 ක් ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී අයකරන ලද සේවක ණය රු.61,710 ක් ණයහිමි ගිණුමට බැර කිරීම නිසා ණයගැති ගිණුම හා ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද සේවක ණය ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.45,474 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් පැවතුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා රු.278,908 ක් වූ පොදු පරිපාලනය යටතේ ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා වියදම් රු.1,695,840 ක් ලෙස දැක්වීම නිසා වර්ෂයේ වියදම රු.1,416,932 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,498,460 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,519,844 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 726 | 741 | 482 |
| (ii) | බදු කුලී | 901 | 613 | 667 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 900 | 877 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,037 | 2,291 | 6,012 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,000,000 |
| (ii) | මුද්දර ගාස්තු | 720,000 |

## 2.3 පාඩු

සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රමවල නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී මිලදී ගෙන තිබුන රු.561,305 ක් වූ ජලනල උපකරණ තොගයකින් 2013 ජුනි 10 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී රු.47,887 ක් වටිනා උපකරණ ඌනතාවයක් විය.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජල පාරිභෝගිකයින් 1011 දෙනෙකුගෙන් ජල සම්බන්ධතා 248 ක් සඳහා පමණක් ජල මනු සවිකර ගාස්තු අයකරනු ලබන අතර, ජල සම්බන්ධතා 763 ක් සඳහා රු.100 සිට 300 දක්වා වූ මාසික ස්ථාවර ගාස්තුවක් ද ලැගුම්හල් වෙනුවෙන් රු.1000 ක මාසික ස්ථාවර ගාස්තුවක් ද අයකරමින් පැවතුනි. ජල මනු සවිකර පරිභෝජනය කරනු ලබන ජල ප්‍රමාණය මත ගාස්තු අය නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති සන්නිවේදන කුළුණු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අය කරගෙන නොතිබුණි.

(ඇ) තැන්පත් කර වසර 2 ක කාලයක් ඉක්මවා තිබූ රු.136,217 ක් වූ තැන්පත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය